සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## පෙරදිග සංගීතය - I

**නම/විභාග අංකය :-- ..........................................................................** **කාලය : පැය 01යි.**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

1. නිශ්චිත කම්පන සංඛ්‍යාතයකින් යුක්තව සංගීතයේදී භාවිත කරන මිහිරි නාද හඳුන්වන්නේ,
   i. හඬ ලෙසිනි. ii. ස්වර ලෙසිනි. iii. ශබ්දය ලෙසිනි. iv. ඝෝෂා ලෙසිනි.

2. පෙරදිග සංගීතයේ ස්වර හා ස්වර සප්තකය පිළිබඳ නිවැරදි කියමන කුමක් ද?
   i. ප්‍රකෘති ස්වර 7 කි. ඉහළ ම හඬ ඇත්තේ මන්ද්‍ර සප්තකයේය.
   ii. විකෘති ස්වර 5 කි. ඉහළ ම හඬ ඇත්තේ මන්ද්‍ර සප්තකයේය.
   iii. කෝමල ස්වර 5 කි. මධ්‍ය සප්තකයේ ස්වර 12 පිහිටයි.
   iv. සියලු ස්වර 12 කි. මන්ද්‍ර සප්තකයේ ස්වර පහළය.

3. ස රි ගු ම ප ධු නි සං, සං නි ධු ප ම ගු රි ස මෙම ආරෝහණ අවරෝහණ අයත් රාගයේ,
   i. ගාන සමය දිවා ප්‍රථම ප්‍රහරය වේ. ii. වාදී සංවාදී ස්වර ප ස වේ.
   iii. ස ස රි රි ගු ගු ම ම ප මුඛ්‍යාංගය වේ. iv. ජාතිය ඖඩව සම්පූර්ණ වේ.

4. භූපාලි රාගයට අදාළව සත්‍ය තොරතුරු ඇතුළත් වන්නේ, පහත ප්‍රකාශ අතුරින් කුමන ප්‍රකාශයේ ද?
   i. භූපාලි රාගය සම්පූර්ණ ජාති රාගයකි. ii. භූපාලි රාගය ඖඩව ජාති රාගයකි.
   iii. එම රාගයේ ධ ග ස්වර කෝමලව යෙදේ. iv. රි ධ ස්වර වාදී සංවාදී ස්වර වේ.

5. යමන් රාගයේ එක් විශේෂයක් වනුයේ,
   i. කෝමල රි, ධ ස්වර යෙදීමයි. ii. තීව්‍ර මධ්‍යමය යෙදීමයි
   iii. ශුද්ධ ස්වර පමණක් යෙදීමය iv. ප ස ස්වර වාදී සංවාදී ලෙස යෙදීමය.

6. රාගයක ආරෝහණයේ සහ අවරෝහණයේ ස්වර පහ බැගින් යෙදේ නම් එම රාගය අයත් ජාතිය වනුයේ,
   i. සම්පූර්ණ ii. ෂාඩව iii. ඖඩව iv. ඖඩව සම්පූර්ණ

7. රාගධාරී ගීතයක ඇතුළත් වන ප්‍රධාන අංග දෙක
   i. ස්ථායී සහ අන්තරා ii. ආලාප සහ තානාලංකාර
   iii. ආරෝහණ සහ අවරෝහණ iv. වාදී සහ සංවාදී

8. ධෛවත වාදී ගා ස්වර වාදිය ලෙස යෙදේ යන ලක්ෂණ ගී පාදය ඇතුළත් රාගය,
   i. කාෆි ii. භූපාලි iii. යමන් iv. බිලාවල්

9. රාගානුකූලව ස්වරවලින් පමණක් රචනා කර ඇත්තේ,
   i. ලක්ෂණ ගීත ii. සර්ගම් ගීත iii. මධ්‍යලය ගීත iv. රාග ගීත

10. රාග ජාති ස්වර සංඛ්‍යා මගින් දක්වීමේදී ඖඩව ෂාඩව සම්පූර්ණ යන්න පිළිවෙලින් දක්වා ඇත්තේ,

i. 5, 6, 7 ලෙසිනි ii. 6, 5, 7 ලෙසිනි iii. 7, 6, 5 ලෙසිනි iv. 6, 7, 5 ලෙසිනි.

11. දාදරා සහ ජප්තාල දෙකේ මාත්‍රා සංඛ්‍යාව එකතු වූ විට ලැබෙන මාත්‍රා සංඛ්‍යාවට සමාන මාත්‍රා සංඛ්‍යාවකින් යුත් තාලය,

i. කෙහෙර්වා ii. දීප්චන්දි iii. ලාවනී iv. ත්‍රිතාල්

12. හින්දුස්ථානි තාලපද ප්‍රස්තාරණයේදී 2, 3 යන සලකුණින් දක්වනුයේ,

i. සමග්‍රහයයි ii. අනුතාලස්ථානයි iii. යේකාවයි iv. බලියයි

13. ජන ගී වර්ගීකරණය අනුව ''දරු නැලවිලි ගී'' අයත් වන්නේ

i. මෙහෙ ගී වලටය. ii. සමාජ ගී වලටය.

iii. සේ ගී වලටය.. iv. ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණු ගී වලටය.

14. තෝඩායම, පොතේ ඉන්නිසය, උරුට්ටුව වැනි සුවිශේෂී කොටස් ඇතුළත් වනුයේ,

i. සොකරි රංග සම්ප්‍රදායේය. ii. නූර්ති රංග සම්ප්‍රදායේය.

iii. කෝලම් රංග සම්ප්‍රදායේය. iv. නාඩගම් රංග සම්ප්‍රදායේය.

15. 'ගම්භිර කාලිංග නුවර නිරිඳුගෙ වාසල පුරයට' මෙම කවිය ගායනා කිරීම සඳහා යොදා ගත හැකි තාල වාද්‍ය භාණ්ඩය,

i. ගැටබෙරයයි. ii. පහතරට බෙරයයි. iii. දවුලයි. iv. තබ්ලාවයි.

16. ස්වර පුවරුවේ මධ්‍යමය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය වාදනයේදී,

i. කෝමල ධෛවතය යෙදේ. ii. තීව්‍ර මධ්‍යමය යෙදේ

iii. කෝමල නිෂාදය යෙදේ iv. සියලුම ස්වර ශුද්ධව යෙදේ

17. බටහිර සංගීත තාල රූපවල 7/4 තාල සංකේතය යෙදූ විට හින්දුස්ථානි තාල පදය සහ දේශීය තිත නම් කළ හැක්කේ,

i. දාදරා තාලය හා මැදුම් තනි තිත ලෙසය. ii. කෙහෙර්වා තාලය සහ මහ තනි තිත ලෙසය.

iii. ජප් තාලය සහ සුළු මැදුම් දෙතිත ලෙසය iv. දීප්චන්දි තාලය සහ මැදුම් මහ දෙතිත ලෙසය.

18. සර්ගම්, ලක්ෂණ ගී, මධ්‍යලය ගී යන තුන් වර්ගයට ම පොදු වූ ලක්ෂණයක් වනුයේ,

i. පද මාලාවක් යොදා ගැනීම ii. ස්ථායී අන්තරා ආකෘතියක් යොදා තිබීම

iii. ස්වර පමණක් යොදා ගැනීම iv. ත්‍රිතාලය මත රචනා යොදා ගැනීම

19. විශාරද බී. වික්ටර් පෙරේරා (දේශීය) පණ්ඩිත් වී.ජී. ජොග් (හින්දුස්ථානි) යන සංගීතඥයන් දෙදෙනා ප්‍රවීණත්වය දැරූ සංගීත වාද්‍ය භාණ්ඩය වන්නේ,

i. වයලීනය ii. බටනලාව iii. සිතාරය iv. එස්රාජය

20. පසන්, තිර්ලානා, වඩිමුඩි, තංගපාට ආදි තාලපද නාඩගම් රංග සම්ප්‍රදායේ භාවිතා වේ. එම තාල වාදනය සඳහා සුදුසු වාද්‍ය භාණ්ඩය නම්,

i. මෘදංගය ii. තවිල් iii. සටම් iv. මද්දලය


21. සිතාරයේ සහ එස්රාජයේ ස්වර පිහිටන ස්ථාන දැක්වීමට පර්දා (Frets) යොදා ඇත. නමුත් ස්වරයේ 2 ක් පර්දා යොදා නැත. එම ස්වර 2 නම්,


i. ශුද්ධ ගාන්ධාරය සහ නිෂාදය ii. කෝමල රිෂභය කෝමල ධෛවතය

iii. කෝමල ගාන්ධාරය සහ නිෂාදය iv. තීව්‍ර මධ්‍යමය හා කෝමල ධෛවතය

22. 'පල දරන තුරු පතර  සරති සියොතුන් නිතර' මෙම ගී පාදය වැයීමට වඩාත් සුදුසු තාලය

i. ත්‍රිතාලය        ii. ඩාඩ්ප් තාලය        iii. දීප්චන්දි තාලය        iv. කෙහෙර්වා තාලය




23. ඉහත A සහ B රූප සටහන් දෙකෙහි පිළිවෙලින් දක්වා ඇත්තේ,

i. අඩු තාරතාවයක් ඇති නාදයක සහ වැඩි තාරතාවක් ඇති නාදයක චලන රටා වේ.

ii. වැඩි තාරතාවක් ඇති නාදයක සහ අඩු තාරතාවක් ඇති නාදයක චලන රටා වේ.

iii. අඩු විපුලතාවක් ඇති නාදයක සහ වැඩි විපුලතාවක් ඇති නාදයක චලන රටා වේ.

iv. වැඩි විපුලතාවක් ඇති නාදයක සහ අඩු විපුලතාවක් ඇති නාදයක චලන රටාව වේ.

24. ඩබ්.බී. මකුලොලුව මහතා විසින් සංගීත ක්ෂේත්‍රයට එකතු කළ ග්‍රන්ථය

i. සිංහල ගැමි නාටකය        ii. පෙරදිග සංගීත ශාස්ත්‍රය.

iii. භාවිත ගීත        iv. හෙළ ගී මග

25. රංග විසින් වයලීනයේ D3 තතෙහි දබරැගිල්ල අංක 01 ලෙස ද මැදගිල්ල අංක 02 ලෙස ද වෙදගිල්ල අංක 03 ලෙස ද නම් කර බිලාවල් රාගය වැයීමේදී අංක 03, 02, 03, 01 වශයෙන් වාදනය කරන ලද්දේ කිනම් ස්වර විය හැකි ද?

i. ග රි ස රි        ii. ම රි ග රි        iii. ග ප ම ග        iv. ම ග ම රි

26. නූර්ති සංගීතය සඳහා ආභාෂය ලැබී ඇත්තේ,

i. කර්ණාට සංගීතයෙනි        ii. වංග සංගීතයෙනි

iii. බටහිර සංගීතයෙනි        iv. උත්තර භාරතීය සංගීතයෙනි

27. ශ්‍රී ලංකාවේ ග්‍රැමෆෝන් තැටිවලට ඇතුළත් කළ මුල් ම ගීත විශේෂය වන්නේ,

i. ස්වාධීන සරල ගීත        ii. නූර්ති ගීත        iii. ජන ගීත        iv. ශාස්ත්‍රීය ගීත

28. පද මාලාවක ශෝකාත්මක බව හෝ භක්තියමය රසය දනවීම සඳහා රාගධාරී සංගීතය ආශ්‍රයෙන් තනුවක් නිර්මාණය කිරීමට සුදුසු රාගයක් ලෙස නම් කළ හැක්කේ,

i. යමන් රාගය        ii. භෛරවී රාගය

iii. බිලාවල් රාගය        iv. වර්ණ චක්‍ර පහන්ය.

29. ප්‍රේක්ෂක ප්‍රතිචාර සම්බන්ධව වැරදි ප්‍රකාශය තෝරන්න.

i. ධාරාලෝක පහන්ය.        ii. අල්ට්‍රා වයලට් පහන්ය.

iii. චලනය වන යොමු පහන්ය.        iv. වර්ණ චක්‍ර පහන්ය.

30. විරිඳු ශෛලියේ ගීත ඇතුළත් නාට්‍ය තෝරන්න.

i. මධුර ජවනිකා        ii. රාජකපුරු

iii. තටු        iv. තාරාවෝ ඉගිලෙති

♦ **අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු පහත දැක්වෙන A, B, C, D යන කොටස් උපයෝගී කරගනිමින් පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| සිරිසඟබෝ | ඉයුජින් | ජසයා | මනමේ |
| වෙස්සන්තර | බැලසන්ත | ලෙන්චිනා | සිංහබාහු |
| දුටුගැමුණු | බ්‍රම්ෂෝට් | මුදලි | හුණුවටය |

31. ඉහත A, B, C, D යන කොටස් නම් කළ යුතු වන්නේ,

    i. A නාඩගම්, B නූර්ති, C නව නාට්‍ය, D කෝලම්

    ii. A නූර්ති, B නඩගම්, C කෝලම්, D නවනාට්‍ය

    iii. A නඩගම්, B නූර්ති, C කෝලම්, D නවනාට්‍ය

    iv. A නූර්ති, B නාඩගම්, C නව නාට්‍ය, D කෝලම්

32. B කොටසට අයත් නාට්‍යවල සංගීත නිර්මාණයට පදනම් කරගෙන ඇත්තේ,

    i. උතුරු ඉන්දියානු සංගීතය    ii. කර්ණාටක සංගීතය

    iii. වංග සංගීතය    iv. හින්දුස්ථානී සංගීතය

33. සෑම චරිතයක් ම වෙස්මුහුණු පැළඳ ඉදිරිපත් කරනු ලබන රංගණය ඇතුළත් වන්නේ,

    i. A කොටස ය.    ii. B කොටස ය.    iii. C කොටස ය.    iv. D කොටස ය.

34. සර්පිනාව සහ තබ්ලාව සහාය සංගීත භාණ්ඩ ලෙස භාවිත කරනුයේ,

    i. A කොටස ය.    ii. B කොටස ය.    iii. C කොටස ය.    iv. D කොටස ය.

35. D කොටසට අයත් ගීතයකි.

    i. දන්නෝ බුදුන්ගේ    ii. ආල වෙලා පියසේ පටන්

    iii. ගම්භිර තෙදැති කොන්ස්තන්තීනුපුරේ    iv. ගල් ලෙන බිඳලා

36. |සි න හ|වෙන් හෝ S|ක ථා S|වෙන් බෑ S|ලෙස ගැයෙන ගීතයට තාල වාදනය සඳහා සුදුසු බටහිර තාලය (Rhythm)

    i. 5/4    ii. 7/4    iii. 6/8    iv. 3/4

37. බටහිර සංගීතයට අනුව ඩොටඩ් මිනිම් (Dotted Minim) සෙමි බ්‍රිව් (Semibreve) සංකේත අවශ්‍ය වන්නේ පහත කුමන ගී පාදය ප්‍රස්තාර කිරීමට ද?

    i. |ග ම|ප ග|ම ග|රි |    ii.|ස රි|ස රි|ප |ප |

    iii.|ස රි ස|රි ග රි|ග ම ග|ප ප |    iv.|ස රි ග ම|ප ස|නි නි ධ ධ|ප |

38. F Major chord එකට අයත් ස්වර පිළිවෙලින්

    i. ම ධ ස වේ.    ii. ප නි රි වේ.    iii. රි ම´ ධ වේ.    iv. ස ග ප නි වේ.

39. පල්ටා, කායදා, පරන් තිහායි යන පාරිභාෂික පද භාවිත වන්නේ කුමන භාණ්ඩයකට අදාළව ද?

    i. වයලීනය    ii. තබ්ලාව    iii. සිතාරය    iv. මද්දලය

40. නන්දා මාලනී මහත්මිය ගයන ''සරුංගලේ වරල් සැලේ'' යන ගීතයට පාදක වූ රාගයේ ඇතුළත් ස්වර සංගතියකි,

    i. පධ̣සරි ගරි ගරිග    ii. ගපධනිස්නිධප    iii. නි̣ධ̣ නිරිසනි̣ප̣    iv. රිගුරිම ගුරිස

(ල.1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## පෙරදිග සංගීතය - II

කාලය : පැය 02යි.

නම/විභාග අංකය :-- ..........................................................................................................................................................

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

1. i. පදසරිස, පදසරිගපගරිස, පදසරිගපධපගරිස යන ස්වර අභ්‍යාසය අයත් රාගය කුමක් ද? (ලකුණු 01)

ii. හින්දුස්ථානී තාලපදයක මුල් මාත්‍රාවේ සිට අවසාන මාත්‍රාව දක්වා යේකාව වරක් වැයීම කිනම් නමකින් හඳුන්වයි ද? (ලකුණු 01)

iii. ගිටාරයේ තත් සුසර කරන අනුපිළිවෙල ලියා දක්වන්න. (ලකුණු 01)

iv. කපිරිඤ්ඤා සංගීතය මෙරට ව්‍යාප්ත වූයේ කිනම් කාල වකවානුවක ද? (ලකුණු 01)

v. කලාසම යන අංගය භාවිත වන වන්නම් සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශය නම් කරන්න. (ලකුණු 01)

vi. |ස ද වා|S සු දු|වැ ලි පි|වි තු රු| යන ගී පාදය අයත් වන්නේ කිනම් පැදි වර්ගයට ද? (ලකුණු 01)

vii. ස්වර මණ්ඩලයක් ඊළඟ විභාග කොටස් 2 තුළ ද වැයෙන බව සරල සංගීතයේදී නිරූපණය වන සංකේතය කුමක් ද? (ලකුණු 01)

viii. ''රෝජා'' චිත්‍රපටයේ සංගීත නිර්මාණකරු නම් කරන්න. (ලකුණු 01)

ix. සී ද එස්. කුලතිලක මහතා ...................................................................................... යන කෘතිය රචනා කරමින් සංගීතයේ උන්නතියට දායක වූ අතර ජන ගී ඇසුරින් ........................................................... යන සරල ගීතය ද එතුමාගේ නිර්මාණයකි. (ලකුණු 02)

x. ලෝක ප්‍රකට සිතාර් වාදකයා ලෙස ...............................................................සංගීතඥයා හැඳින්විය හැකි අතර විද්‍යුත් සංගීතය සංධ්වනි වාද්‍ය වෘන්දය සමග මුසු කරමින් නූතන සංගීතයේ නිර්මාණකරුවෙකු ලෙස ............................... ............................... සංගීත ශිල්පියා හැඳින්විය හැකි ය. (ලකුණු 02)

(ලකුණු 12)

2. පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග තුනකට අයත් ස්වර ඛණ්ඩයන් ය.

A) නි ස ග ම| ප ධ ප ම| ග ප ම| ග රි ස |

B) ග ග රි |ග ම/ ප ම/| ග රි ග රි| ස නි රි|

C) නි ධ ප ම|ග ග රි රි|රි ප ම ප|ම ග රි ස|

i. ඉහත A,B,C ස්වර පාද අයත් රාග තුන නම් කරන්න. (ලකුණු 03)

ii. මින් ඔබ කැමති එක් රාගයක මධ්‍යලය ගීතයක සර්ගම් ගීතයක හෝ ලක්ෂණ ගීතයක ස්ථායී කොටස පමණක් නියමිත තාල සලකුණු යොදා ප්‍රස්තාර කරන්න. (ලකුණු 05)

iii. ඔබ තෝරා ගත් රාගය හැර අනෙක් රාග දෙකෙන් එකකට අදාළව මාත්‍රා අටකට නොඅඩුවන සේ තානාලංකාර දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

3.පහත දැක්වෙන වන්නම් ඇසුරු කරගනිමින් පිළිතුරු සපයන්න.

| | වන්නම් ගී පාදය | සම්ප්‍රදාය |
|---|---|---|
| a) | මෝරාSS ׀ SSSS | උඩරට |
| b) | කොහොව් ׀ යනාS ׀ හඬන ׀ ගනාS | සබරගමු |
| c) | සේSS ׀ විSතS ׀ පාSS ׀ දSසS | පහතරට |

i. ඉහත a,b,c යන සම්ප්‍රදායන් තුන සඳහා භාවිත කරනු ලබන තාල වාද්‍ය භාණ්ඩ පිළිවෙලින් නම් කරන්න.(ලකුණු 03)

ii. තාල දෙකක් මත ගැයෙන වන්නම අයත් සම්ප්‍රදායේ වන්නම්වල ඇති විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

iii. දෙවිනුවර උපුල්වන් දෙවොල ආශ්‍රය කරගනිමින් නිර්මිත වන්නම් සම්ප්‍රදාය නම් කර, එම වන්නමේ ගීතයට අදාළ ස්වර ප්‍රස්තාරය ලියා දක්වන්න. (ලකුණු 06)

4 පහත සඳහන් නාට්‍ය ගීත උපයෝගී කර ගනිමින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a. රතදර සිරි පරදන

b. පළමුව අප වැන්ද බුදුන්

c. අපෙ මුණිසඳ එර්දි බලෙන්

d. රස බොජුනක් නැතත්

1. i. ''පළමුව අප වැන්ද බුදුන්'' යන ගීතය ගායනා කරන චරිතයන් නම් කරන්න. (ලකුණු 01)

ii. අබුද්දස්ස කෝලම නාට්‍යයට අදාළ ගීතය වන්නේ මින් කුමන ගී පාද යද? (ලකුණු 01)

iii. අන්දරේලා නාට්‍යයේ ඇතුළත් ගීත ඛණ්ඩය තෝරා ලියන්න. (ලකුණු 01)

iv. රතදර සිරි පරදන ගීතය ඇතුළත් වන්නේ ............................. නාට්‍යයේ ය. (ලකුණු 01)

2. i. නූර්ති සහ නාඩගම් නාට්‍ය සම්ප්‍රදායේ සංගීතමය ලක්ෂණ සංසන්දනාත්මකව ලියන්න. (ලකුණු 04)

ii. ඔබ උගත් රාග ඇසුරෙන් නිර්මාණය වූ නූර්ති ගීතයක ස්ථායී කොටසෙහි ගී පද ලියා එයට අදාළ රාගය ද නම් කරන්න. (ලකුණු 04)

5. ''කිසියම් වස්තූන් දෙකක් එකිනෙකට ගැටීමෙන් නාද උපදී සංගීතයේ මාධ්‍ය නාදයයි''

i. නාදයේ ත්‍රිවිධ ගුණ නම් කරන්න (ලකුණු 03)

ii. විද්‍යාත්මකව මෙම නාද ඇතිවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. ස ග ම ප යන ස්වරයන්හි සංඛ්‍යාත දක්වන්න. (ලකුණු 02)

iv. ඔබ කැමති සංගීත භාණ්ඩයක නාදමය ගුණය රැකීම සඳහා යොදා ඇති විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

6. සංධ්වනි (symphony) යන මාතෘකාව යටතේ පහත සඳහන් කරුණු යටතේ පිළිතුරු සපයන්න.

i. ස්වරූපය හා විශේෂ ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

ii. නිර්මාණය කළ සංගීතඥයින් දෙදෙනෙකු ලියා දක්වන්න. (ලකුණු 02)

iii. ප්‍රචලිත සංධ්වනි හතරක් ලියා දක්වන්න. (ලකුණු 02)

iv. සංධ්වනියක් සඳහා යොදා ගත් සංගීත භාණ්ඩ (ලකුණු 02)

v. අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය වන ප්‍රධාන කොටස් තුන නම් කරන්න. (ලකුණු 04)

7. | ස රි ග | ම ප | ප ම ග | රි ස

i. ඉහත රාග ගී පාදය මධ්‍යම භාවයට හරවා ලියා දක්වන්න. (ලකුණු 04)

ii. ඉහත පෙරදිග ප්‍රස්තාරය අපරදිග ප්‍රස්තාර ක්‍රමයට පෙරලා ලියන්න. (ලකුණු 04)

iii. එම ප්‍රස්තාරයට අදාළ අපරදිග ටයිම් සිග්නේචරය (Time Signature) ලියා එයට ගැලපෙන හින්දුස්ථානි තාල පදය නම් කරන්න. (ලකුණු 02)

iv. Crotchet, Minim, Dotted Minim, Semi breave සංකේත ලියා දක්වන්න. (ලකුණු 02)

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. (ii) | 2. (iv) | 3. (i) | 4. (ii) | 5. (ii) | 6. (iii) | 7. (i) | 8. (iv) | 9. (iv) | 10. (ii) | 11. (iv) | 12. (ii) | 13. (ii) | 14. (iv) |
| 15. (ii) | 16. (iii) | 17. (iv) | 18. (ii) | 19. (i) | 20. (iv) | 21. (ii) | 22. (ii) | 23. (i) | 24. (iv) | 25. (iv) | 26. (iv) | 27. (ii) | 28. (ii) |
| 29.(iii) | 30. i | 31. (ii) | 32. (ii) | 33. (iii) | 34. (i) | 35. (iv) | 36. (ii) | 37. (iv) | 38. (i) | 40. (iv) | | | |

### II පත්‍රය

1. i. භූපාලි රාගය ii. ආවර්තය iii. ග ධ රිපනිග (අපරදිග ස්වර ලිවිය හැකිය) iv. පෘතුගීසීන්ගේ කාලයේදී
v. රත්නපුර vi. දොළොස්මත් පැදි vii. ˙//. viii. ඒ.ආර්. රහුමාන්
ix. සංගීත සම්භවය දැතට වළලු x. රවි ශංකර් යානි

2. i. A) භෛරවී රාගය B) යමන් රාගය C) කාෆි රාගය (ලකුණු 03)
ii. නිවැරදිව අදාළ ස්ථායි කොටස (ලකුණු 05)
iii. නිවැරදි තානාලංකාර දෙකකට (ලකුණු 04)
**(ලකුණු 12)**

3. i. a - ගැටබෙරය ( උඩරට බෙරය) b දවුල c පහතරට බෙරය (යක්බෙර) (ලකුණු 03)
ii. සබරගමු වන්නමේ විශේෂ ලක්ෂණ 3 කට (ලකුණු 03)
iii. පහතරට සම්ප්‍රදාය නියමිත ස්වර සඳහා (ලකුණු 04)
iv ගැමි ගී / සේ ගී ලක්ෂණ 2 සඳහා (ලකුණු 02)
**(ලකුණු 12)**

4. i. ජැංඩි සිංඤෝ (ල.1) ii. අපෙ මුණි සඳ (ල.1) iii. රස බොජුනක් (ල.1) iv. කුස පබාවතී (ල.1)(ලකුණු 04)
ii. නූර්ති / නාඩගම් සංගීතමය ලක්ෂණ ලිවීම සඳහා (ලකුණු 04)
iii. නූර්ති ගීතය හා රාගය ලිවීම සඳහා (ලකුණු 04)

5. i. ත්‍රිවිධ ගුණ නම් කිරීම (ලකුණු 03)
ii. විද්‍යාත්මකව කරුණු ලියා තිබීම (ලකුණු 05)
iii. ස 256 ග 320 ම 340 ප 384 (ලකුණු 02)
iv. භාණ්ඩයේ නාදමය ලක්ෂණ සඳහා (ලකුණු 02)
**(ලකුණු 12)**

6. i. i, ii, iii, iv පිළිතුරු සපයා ඇති පරිදි කොටසකට ල. 2 බැගින් (ලකුණු 08)
ii. භාණ්ඩ වර්ගීකරණයට (ලකුණු 04)
**(ලකුණු 12)**

7. i. මධ්‍යම භාවය ලිවීම ම ප ධ නි| ස් |ස් නි ධ ප |ම (ලකුණු 04)
ii. අපරදිග ප්‍රස්තාරය නිවැරදිව ලිවීම (ලකුණු 04)
ටයිම් සිග්නේචරය $^4/_4$ ත්‍රිතාලය හෝ කෙහෙර්වා (ලකුණු 02)
♩, 0', 0.', 0 (ලකුණු 02)
**(ලකුණු 12)**